# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2260/49 - 2021 දෙසැම්බර් මස 29 වැනි බදාදා - 2021.12.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වගන්තියෙන් මා වෙත පැවරි ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, කුරුණෑගල උතුරු නගර ජල සම්පාදන ව්‍යාපෘතියෙහි කහටපිටිය (රණවන) ජල කුළුණ ඉදි කිරීම සඳහා ඉඩම් කොටස් අවශ්‍යාව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස්වල නිශ්චල දේපළ අයිතිය අත් කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

2021 ක් වූ දෙසැම්බර් මස 20 වැනි දින,

යොමු අංකය: DVP/02/03/KG/337
ජල සම්පාදන අමාත්‍යාංශය,
“ලක්දිය මැදුර“,
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 723, රණවන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රණවන ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ආර්. ඩි. එම්. පී. ආර්. රාජපක්ෂ මහතා විසින් මැන සකස් කරන ලද අංක 70/2015 දරන පිඹුරේ කැබලි අංක 1 න් කොටසක් හා අංක 75/2015 දරන පිඹුරේ කැබලි අංක 1 වශයෙන් දැක්වෙන “නෙළුම්පත් වැව" නමැති ඉඩම්වලින් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 40ක් පමණ වන ඉඩම් කොටස්.

පිඹුරේ අංකය - 70/2015
කැබලි අංක - 01න් කොටසක්
ඉඩමේ ප්‍රමාණය - පර්. 22

1A - G 35705 – 21 (2021/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**මායිම්**

*උතුරට*: මෙම ඉඩමේ ඉතිරි කොටස; *නැගෙනහිරට*: මූලික පිඹුරු අංක කු 2079 හි කැබලි අංක 1; *දකුණට*: බලයලත් මිනින්දෝරු ජී. ඒ. සිල්වා විසින් මැන සකස් කරන ලද අංක 1922 දරන පිඹුරේ කැබලි අක්ෂර E; *බටහිරට*: කුරුණෑගල - දඹුල්ල සිට වැල්ලව දක්වා දිවෙන මාර්ගය (ප්‍රාදේශීය සභා).

පිඹුරේ අංකය - 75/2015
කැබලි අංක - 01
ඉඩම් ප්‍රමාණය - පර්. 18

*උතුරට*: බලයලත් මිනින්දෝරු ජී. ඒ. සිල්වා මහතා විසින් මැන සකස් කරන ලද අංක 1922 දරන පිඹුරේ කැබලි අක්ෂර D; *නැගෙනහිරට*: මෙම ඉඩමේ ඉතිරි කොටස; *දකුණට*: මූලික පිඹුරු අංක කු 2079 හි කැබලි අංක 1; *බටහිරට*: කුරුණෑගල - දඹුල්ල සිට වැල්ලව දක්වා දිවෙන මාර්ගය (ප්‍රාදේශීය සභා).

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය -. ආර්. ඒ. එම්. විජේසිංහ, රණවන, තෝරයාය.

EOG 12 - 0322

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.